ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**

මගේ අංකය / My Number: USJP/EEX-05/2025
ඔබේ අංකය / Your Number:
දුරකථනය / Telephone: 011-2801481, 0113-485404
ෆැක්ස් / Fax: 011-2802753
ලිපිනය / Address: තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල, නුගේගොඩ, ශ්‍රී ලංකා, Post Box 10, Gangodawila, Nugegoda, Sri Lanka ,
වෙබ් අඩවිය / Website: www.external.sjp.ac.lk
විද්‍යුත් තැපැල / E-mail: exams.edecu@sjp.ac.lk

2025.12.31

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි,

## 2022/2023 වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි III පරීක්ෂණය (නව විෂය නිර්දේශය) විභාග අයදුම්පත් කැඳවීම - 2026

ඉහත පරීක්ෂණයට අයදුම් කිරීමට සහ පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන ලෙස කරුණාවෙන් දන්වා සිටිමි.

| | |
|---|---|
| **පරීක්ෂණය සඳහා අයදුම් කිරීම** | ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස, Examination → Application Freshers හි ඇති විෂයයන් එකින් එක තෝරා Apply කළ යුතු වේ. (උපාධි III පරීක්ෂණයට අදාළ විෂයයන් 6 මේ ආකාරයෙන් Apply කළ යුතුය) |
| **පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය ලබා ගැනීම සහ පරීක්ෂණ ගාස්තු ගෙවීම** | පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා ඔබට අදාල ගිණුම් අංකය ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස Student හි ඇති payments මඟින් ලබාගෙන දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් හෝ (Master/ Visa) (Credit හෝ Debit Card) මඟින් ගෙවීම් කළ හැක. **(සැලකිය යුතුයි:** ගිණුම් අංකය ලබා ගැනීමේදී අනිවාර්යයෙන් **Reason for the payments** නිවැරදිව තෝරා ගත යුතුය) |
| **පරීක්ෂණ ගාස්තු** | **රු.15,000.00** |
| **අයදුම්පත් යොමු කළයුතු අවසාන දිනය** | 2026 ජනවාරි 23 (රාත්‍රී 12.00 දක්වා) |

**සැලකිය යුතුයි**

I. පරීක්ෂණ අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම පාඨමාලා ගාස්තු දෙවන හා තෙවන වාරික සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. එසේ ගෙවා නොමැති කිසිඳු අපේක්ෂකයකුට පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

II. අයදුම්පත් යොමු කිරීමේ (Apply) අවසන් දිනය 2026/01/23 **(රාත්‍රී 12.00 දක්වා)** වන අතර එම දිනයෙන් පසුව කිසිඳු හේතුවක් මත පරීක්ෂණය සඳහා අයදුම්කළ නොහැක.

III. පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා ඔබට අදාල ගිණුම් අංකය ඔබගේ තොරතුරු ගොනුව **(Student Profile)** වෙත පිවිස **(Student)** හි ඇති **payments** මඟින් **ලබාගෙන දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් හෝ මාස්ටර්/වීසා (Master/ Visa) (Credit හෝ Debit Card) මඟින් ගෙවීම් කළ හැක. බැංකුවට ගෙවීම් කිරීමෙන් පසු ලබාදෙන කුවිතාන්සිය ඔබවෙත සුරැකිව තබාගත යුතු අතර, වෙනත් ගිණුම් අංක වලට ගෙවන ලද මුදල් පිළිබඳව විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ.**
**(සැලකිය යුතුයි:** ගිණුම් අංකය ලබා ගැනීමේදී අනිවාර්යයෙන් **Reason for the payments** නිවැරදිව තෝරා ගත යුතුය)

IV. නියමිත පරිදි පරීක්ෂණ ගාස්තු ගෙවා නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණයට පෙනී සිටීම සඳහා කිසිඳු අවස්ථාවක් නොමැත.

V. පරීක්ෂණයට අදාළ කාල සටහන **www.external.sjp.ac.lk** යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියළු දැනුවත් කිරීම් වෙබ් අඩවිය/ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) හරහා පමණක් සිදු වේ.

VI. විදේශ ගත සිසුන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ පෙනී සිටිය හැක. ඒ සඳහා වන විස්තර **http://external.sjp.ac.lk/online-exminations-for-migrated-students/** යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

VII. ඉහත පරීක්ෂණය සඳහා නියමිත දිනට මුදල් ගෙවා අයදුම් කරන ලද සිසුන්ගේ විභාග ප්‍රවේශපත්‍ර ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස Examination හි ඇති Admission වෙත පිවිස බාගත Download හැක. විභාග ප්‍රවේශපත්‍ර තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව සලකන්න.

VIII. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය 428 වන සනාතන සභාව විසින් අනුමත කරන ලද සංශෝධිත නව විභාග නීති රීති මාලාව **external.sjp.ac.lk/B.Com (General) External Degree/ Examinations/ Rules and Regulations** වෙත පිවිස පරිශීලනය කල හැක.

IX. **උපාධියක් සම්පූර්ණ කිරීම :** උපාධිය ලැබීම සඳහා අවශ්‍යතාවන් පිළිබඳ විස්තර **www.external.sjp.ac.lk** වෙබ් අඩවියේ පල කර ඇති ඔබගේ අධ්‍යයන වර්ෂයට අදාළ ශිෂ්‍ය විවරණිකාව (Prospectus ) පරිශීලනය කිරීමෙන් ඔබට ලබා ගත හැකිය.

X. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 09/2021 අනුව ඔබට අදාල උපාධි සහතිකය සහ විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනය නිකුත් කරනුයේ ඔබ විසින් බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේදී ඉදිරිපත් කරන ලද උප්පැන්න සහතිකයේ සඳහන් නමට පමණි. ඒ අනුව මේ සමඟ ඇති අයදුම් පත්‍ර අංක 1 නිවැරදිව සම්පූර්ණ කර උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපතක් සමඟ, නියෝජ්‍ය ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට 2026 ජනවාරි 23 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ**

**428 වැනි සනාතන සභාව විසින් අනුමත කරන ලද විශේෂ කරුණු**

**පරීක්ෂණයට පෙනී නොසිටීම සම්බන්ධයෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම**

- රෝගී තත්ත්වයේ ස්වරූපය මත, අසනීප නිසා මුළු විභාගය හෝ විභාගයේ අදාළ කොටසකට හෝ පෙනී නොසිටින බාහිර විභාග අපේක්ෂකයන් ඒ බව විභාගය ආරම්භ වීමට අවම වශයෙන් **විනාඩි තිහකට පෙර** පෙර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරී වෙත වාර්තා කළ යුතු ය. ඊට අදාළ වෛද්‍ය සහතිකය පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ **නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැළැස්විය යුතු ය.**
- නොවැළැක්විය හැකි හේතුවක් මත එසේ කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් එම හේතුව සනාථ කරමින් සාක්ෂි සමග තමා පදිංචි ප්‍රදේශයේ රජයේ ආරෝග්‍ය ශාලාවකින් ලබා ගත් වලංගු වෛද්‍ය සහතිකයක් පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී **දින 14ක් ඇතුළත** බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැළැස්විය යුතු ය.
- පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන රජයේ පිළිගත් බටහිර, ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන්ගෙන් ප්‍රතිකාර ලබාගන්නා අපේක්ෂකයෙකු තමා ලබාගත් වෛද්‍ය සහතිකය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී හමු වී ඔහු ලවා සහතික කරවා ගත යුතු ය. එම සහතිකය පෙනී සිටීමට නොහැකි වූ විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී **දින 14ක් ඇතුළත** බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැළැස්විය යුතු ය.

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2025-12-31